# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,726/2 — 1966 දෙසැම්බර් 17 වැනි සෙනසුරාදා — 1966.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

### මිළ පාලන පනත

### ආඥාව

(173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, (විවිධ ද්‍රව්‍ය) මිළ පාලක, දෙරණියගලගේ බැසිල් අයිවෝර් පිරිස් සමරනායක සිරිවර්ධන වන මම, 1966 අගෝස්තු 10 සහ අංක 14,707/12 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1966 සැප්තැම්බර් 14 සහ අංක 14,712/2 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාවෙන් සංශෝධනය කරන ලද, 1966 අංක 5 දරණ (ආනයනිත රෙදිපිළි සහ ආනයනිත රෙදිපිළි ද්‍රව්‍ය නිෂ්පාදන) මිළ පාලන ආඥාව, එකී ආඥාවට යාකොට ඇති (අ) උපලේඛනය වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරමි.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
මිළ පාලක (විවිධ ද්‍රව්‍ය).

1966 දෙසැම්බර් 16 දින,
කොළඹ,
ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය (අ)

| 1 වැනි තීරය<br>ආනයනික රෙදිපිළි හා ආනයනිත රෙදිපිළි ද්‍රව්‍ය නිෂ්පාදන | 2 වැනි තීරය<br>යාරයකට ආනයනිකයාගේ උපරිම තොග මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>යාරයකට තොග වෙළෙන්දගේ උපරිම තොග මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>යාරයකට සිල්ලර වෙළෙන්දගේ උපරිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. කෘතිම පට කව්චි රෙදි (රේයොන් සහ සෙලූලෝස්, කෘතිම පයිබර් සින්තටික් ෆයිබර් සහ ස්පන් ග්ලාස් සහ වෙනත් කෘතිම ෆයිබර් ඇතුළුව) | | | |
| (අ) ක්‍රෙප්, සැටින්, ටැෆටා, ශියර් ක්‍රෙප් සහ මස්ලින් (පර්නිෂින් ෆැබ්රික් හැර) සහ පළල අඟල් 36 ට වැඩි නොවූ සායම් කරන ලද නයිලෝන් සැටින් ... | 2 21 | 2 43 | 2 79 |
| (ආ) රේයෝන් සහ රේයෝන් මිශ්‍රණ සූටිං රෙදි ... ... ... | 5 50 | 6 0 | 6 50 |
| (ඇ) පළල අඟල් 44 ක් වූ මුද්‍රිත රේයෝන් සහ නයිලෝන්, මස්ලින්, මුද්‍රිත රේයෝන් සහ නයිලෝන් සහ නයිලෝන් ක්‍රෙප් සහ ටැෆටා ... ... | 6 50 | 7 0 | 7 50 |
| (ඈ) පළල අඟල් 36 ට වැඩි නො වූ සායම් කරන ලද නයිලෝන් සැටින් ... | 4 50 | 4 95 | 5 45 |
| (ඉ) පළල අඟල් 44 සහ ඊට වැඩි වූ සායම් කරන ලද නයිලෝන් සැටින් ... | 5 75 | 6 35 | 7 0 |
| 2. කපු රෙදි කව්චි— | | | |
| (අ) නිල් පාට ඩ්රිල් හා කාකි ඩ්රිල් ... ... ... | 2 5 | 2 12 | 2 43 |
| (ආ) පළල අඟල් 36 ට වැඩි නොවන පොප්ලින්, සුදු හා සායම් කරන ලද සහ මුද්‍රිත ෆැබ්රික් සායම් කරන ලද හා මුද්‍රිත ෆැබ්රික්, සුදු රෙදි හා මල් හැර ... | 1 69 | 1 85 | 2 12 |
| (ඇ) පළල අඟල් 52 ක් වූ සුදු කපු මල් හා සුදු රෙදි ... ... ... | 1 58 | 1 70 | 1 90 |

12–1162


1030/3——ආර් ආර් 19889—14,425 (66/12)

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 35/66 දරන ආනයන පාලන දැන්වීම

### ආනයනයන් සඳහා ප්‍රවාහණ ගාස්තු සහ රක්ෂණ ගාස්තු ගෙවීම

1967. 3. 31 දිනින් පසු නිකුත් කෙරෙන පංගු වෙන් කිරීමේ ලිපි වෙනුවෙන් නිකුත් කරන ආනයන බලපත්‍ර මත කරනු ලබන සියලු ආනයනයන් වෙනුවෙන් වූ ඉන්වොයිස් පත්‍රවල ප්‍රවාහණ ගාස්තු සහ රක්ෂණ ගාස්තු වෙන් වෙන් වශයෙන් පෙන්විය යුතු බව බඩු ආනයනය සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් බලපත්‍ර ලබන ආනයනකයින්ට මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. දැනට පවත්නා ක්‍රමය වූ බඩුවල මිළට, ප්‍රවාහණ ගාස්තු සහ රක්ෂණ ගාස්තු එකතු කර පෙන්වීම වෙනුවට ප්‍රවාහණ ගාස්තු සහ රක්ෂණ ගාස්තු වෙන්කොට සැපයුම්කරු බඩු සඳහා අය කරන මිළ වෙන් වශයෙන් පෙන්විය යුතුයි.

3. ආනයන ලියකියවිලිවල රක්ෂණ ගාස්තු සහ ප්‍රවාහණ ගාස්තු වෙන වෙන විෂයයන් වශයෙන් පෙන්වීම ඉතා වැදගත් ය.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

1966. 12. 16 වැනි දා,
කොළඹ දී.

12-1157

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි